පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120
ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635
දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)
වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk
ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk

මගේ අංකය / எனது இலக்கம் / My NO — 472/ 2024
ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024
දිනය / திக / Date — 17/03/2024 පැය 1655

# මාධ්‍ය නිවේදනය

## දියේ ගිලී දරුවන් දෙදෙනෙකු මියයාම - යක්කලමුල්ල පොලිස් වසම.

2024.03.17 වන අද දින දහවල් කාලයේ යක්කලමුල්ල පොලිස් වසමේ පොල්පාගොඩ, ගිරිපුරාව පාලම ආසන්නයේ පොල්අතුමෝදර ගඟෙහි දිය නෑමට ගිය දරුවන් දෙදෙනෙකු දියේ ගිලී මියගොස් ඇති බවට යක්කලමුල්ල පොලිසියට ලද පණිවිඩයක් අනුව විමර්ශන ආරම්භ කර ඇත.

**මෙලෙස මියගොස් ඇත්තේ වයස අවුරුදු 11 හා 14 වයස් වල පසුවන පොල්පාගොඩ, යක්කලමුල්ල ප්‍රදේශයේ පදිංචිව සිටි පිරිමි දරුවන් දෙදෙනෙකු වේ.**

මොවුන් දෙදෙනා ඥාති සොහොයුරන් වන අතර, අද දින දහම් පාසල් ගොස් යළි නිවෙස් වෙත පැමිණෙමින් සිටින අතරතුර මෙම ගඟෙහි දිය නෑම සඳහා ගොස් සිටියදී දියේ ගිලී ඇති බවට සිදු කරන ලද විමර්ශන වලදී අනාවරණය වී ඇත.

මෘත ශරීර පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා ඉමදූව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර යක්කලමුල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**